**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**
**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂයේ ලැබිය යුතු පුද්ගලික දුරකථන සන්නිවේදන කුළුණු 03ක ගාස්තු සහ ප්‍රචාරක දැන්වීම් පුවරු 05ක එකතුව රු.486,150 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරි කාලයේ මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් වූ රු. 1,570,718ක් වූ ආරක්ෂක කුටියේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 3,380,923ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,392,084ක් විය.

**2.2 මූල්‍ය පාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී අගරු වූ රු.100,240 ක චෙක්පතක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මුදල් පොතේ අවශ්‍ය ගැලපීම් සිදු කර තථ්‍ය මුදල් ශේෂය හඳුනාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂ ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් පොතේ අවශ්‍ය ගැලපීම් සිදු කර තථ්‍ය මුදල් ශේෂය හඳුනා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | වර්ෂ 03කට අධික කාලයක සිට අක්‍රියව පවතින බැංකු ජංගම ගිණුම් 03ක ශේෂ එකතුව රු.3,960,887 ක් ඵලදායී ලෙස ආයෝජනය කර නොතිබුණි. | ආදායම් ඉපැයීමේ මූලාශ්‍රවල යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 6,000 | - | - | - | 1,000 | - | - | - |
| ii. | කුලී | 2,565,000 | 6,736,598 | 3,467,415 | 3,269,183 | 5,720,000 | 6,346,537 | 3,559,851 | 2,786,686 |
| iii. | බලපත්‍ර ගාස්තු | 810,000 | 505,225 | 505,225 | - | 740,000 | 470,890 | 505,225 | - |
| iv. | වෙනත් ආදායම් | 3,758,000 | 2,895,269 | 2,895,269 | - | 3,829,000 | 2,803,673 | 2,895,269 | - |
| | එකතුව | 7,139,000 | 10,137,092 | 6,867,909 | 3,269,183 | 10,290,000 | 9,621,100 | 6,960,345 | 2,786,686 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ සියළුම ආදායම් රැස්කිරිමේ කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | 2022 දෙසැම්බර් 31 දින දක්වා ලංසු මත බදු දීමෙන් ලැබිය යුතු ආදායම රු.1,809,914ක් විය. ඉන් රු.752,388 ක් වර්ෂ 03 සිට 06ක් අතර පරාසයකින් අය කළ යුතුව පැවැතුණු අතර වර්ෂ 20 කට අධික කාලයක සිට හිඟහිටිව පැවැති ප්‍රමාණය රු.510,682 ක් විය. | හිඟහිටි කාලානුරූපීව අය කරමින් පවතින බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | **දුරකථන සන්නිවේදන කුළුණු ගාස්තු** | | |
| | සභාව විසින් අයකළ යුතු දුරකථන සන්නිවේදන කුළුණු ගාස්තු රු.105,000 ක් 2017 වර්ෂයේ සිට අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | නියමිත කාලය තුළ හිඟහිටි අයකර ගැනිමට කටයුතු කරන බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |

(ඇ) **මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.2,596,600ක් විය. | හිඟහිටි අයකර ගැනිමට කටයුතු කළ යුතු බව. | අයකළ යුතු ආදායම් කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 නිෂ්කාර්ය වත්කම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදි රාජ්‍ය නොවන ආයතනයක් විසින් රු.5,000,000ක වියදමින් විනායගපුරම්හි ඉදි කර සභාවට භාරදුන් ධීවරයින් සඳහා වූ පොදු වෙළෙඳපොල පසුගිය වර්ෂ 03කට අධික කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවැතුණි. | ආදායම් ඉපැයිය හැකි ආකාරයෙන් යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අප්‍රමාදව එය භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස් විසින් කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් ලබාදුන් රු.500,000 ක් සහ රු.690,000ක සභාවේ අරමුදල් දායකත්වයෙන් මිලදී ගත් යන්ත්‍රය භාවිතා කිරීමට විගණන දින වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි ඉල්ලීම් වැඩි වූයේ නම් එම යන්ත්‍ර පූර්ණ වශයෙන් භාවිතා කරන බව. | යන්ත්‍ර භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | දාන්ඩියඩිහි අළුතින් ඉදිකළ කාබනික පොහොර මධ්‍යස්ථානය සඳහා රු.1,607,000ක් වටිනා ප්ලාස්ටික් කටර් සහ ගස් කැපීමේ යන්ත්‍ර මිලදී ගෙන තිබුණත් ඒවා භාවිතා කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය ප්‍රදේශයේ ඒවා භාවිතා කිරීමට කටයුතු කරන බව. | යන්ත්‍ර කඩිනමින් භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩානෙයි ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයෙහි භාවිතා කළ කසළ කපා | අළුත්වැඩියා කිරිමට කටයුතු කර ඇති බව. | කඩිනමින් අළුත්වැඩියා කර නැවත භාවිතා |

| | | | |
|---|---|---|---|
| | කුඩු කිරීමේ යන්ත්‍රය දෝෂයට ලක්වී වර්ෂ 03ක් ගත වී තිබුණත් එය අළුත්වැඩියා කර නැවත භාවිතයට ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.එමෙන්ම මෙම මධ්‍යස්ථානයේ ඇති කඩදාසි නිපදවන යන්ත්‍ර දෙකත් වර්ෂ කිහිපයක සිට ක්‍රියා විරහිතව තිබූ අතර ඒවා නැවත භාවිතයට ගත හැකි පරිදි අලුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කර නොතිබුණි. | | කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සභාවේ පවතින වාහන 09ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරි කාලයේදි අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට කටයුතු කරන බව. | වාහන අළුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර මියගිය, විශ්‍රාම ගිය, සහ සේවය හැර ගිය නිලධාරීන් 15ක ගෙන් අයකර ගතයුතු රු.1,019,458ක් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇති බව. | නිලධාරීන්ගෙන් අය කර ගත යුතු හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**4.** **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**
**පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂ කාලපරිච්ඡේදයේ පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන 61ක් පැවැති නමුත් ආයතන23කට පමණක් බලපත්‍ර නිකුත් කර තිබුණි. | පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව, පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |